# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA


මගේ අංකය / எனது இல. / My No. }

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2023/03/09

පැමිණිලිකරු : ජේ.ඒ. සුනිල් මයා.
අංක 20/01, බටකැත්තර,
මඩපාත පාර, පිළියන්දල.

වගඋත්තර පාර්ශවය : 01 නාගරික කොමසාරිස්,
කොළඹ මහ නගර සභාව,
නගර ශාලාව, කොළඹ 07.

02 පළාත් පාලන ලේකම්,
ප්‍රධාන අමාත්‍යාංශය, බස්නාහිර පළාත,
අංක 204, ඩෙන්සිල් කොබ්බැකඩුව මාවත, බත්තරමුල්ල.

03 ආණ්ඩුකාර (බ.ප.),
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
10 වන මහල, අංක 204, ඩෙන්සිල් කොබ්බැකඩුව මාවත,
බත්තරමුල්ල.

04 ලේකම් (බ.ප.),
ප්‍රධාන අමාත්‍යාංශය, බස්නාහිර පළාත,
අංක 204, ඩෙන්සිල් කොබ්බැකඩුව මාවත,
බත්තරමුල්ල.

<u>පැමිණිලි අංකය : HRC/1062/19</u>

**පැමිණිල්ල =:**

ඉහත පැමිණිලිකරු විසින් සිය පැමිණිල්ල මගින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර ඇත්තේ, තමා 2007 වර්ෂයේ නගර සභා ආරක්ෂක




ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office } 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson } 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax } 011-2505541/ 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail } sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி } 94 -11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் } 011-2505521
ස්ථාපිත / தாபித அமைப்பு } 1996
වෙබ් / இணையம் } www.hrcsl.lk

නිලධාරි තනතුරට ඉල්ලුම් කරන ලද බවත්, ඒ වන විට තමාගේ වයස අවුරුදු 43 ක් වූ බවත්, අදාළ තනතුර සඳහා ඉල්ලුම් කිරීම සඳහා සුදුසුකම් ලබන වයස් සීමාව වයස අවුරුදු 45 වන අතර, 2018 වර්ෂයේ සම්මුඛ පරීක්ෂණය පවත්වන අවස්ථාව වන විට තමාගේ වයස අවුරුදු 44 ක් වූ බවත්, නමුත් 2019 ජනවාරි 27 වන දින සම්මුඛ පරීක්ෂණ අවස්ථාව වන විට තමාගේ වයස අවුරුදු 45 ඉක්මවීම හේතුවෙන් තමා වෙත අදාළ තනතුර ලබා නොදුන් බවත් දක්වා ඇත. එමගින් තම මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට පැමිණිල්ලෙන් දක්වා ඇති අතර, ඒ අනුව තමා වෙත ආරක්ෂක නිලධාරි තනතුර ලබා දෙන ලෙසට මෙම පැමිණිල්ලෙන් ඉල්ලා ඇත.

**වගඋත්තරකරුගේ ස්ථාවරය -:**

පැමිණිල්ලට අදාළව කරුණු ඉදිරිපත් කරමින් වගඋත්තර පාර්ශවය සඳහන් කර ඇත්තේ, කොළඹ මහ නගර සභාවේ ආරක්ෂක නියාමක සේවයේ තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා 2017 වර්ෂයේදී අයදුම්පත් කැඳවන ලද අතර, 2017 වර්ෂයේ අදාළ සම්මුඛ පරීක්ෂණය පළාත් පාලන මැතිවරණය හේතුවෙන් පැවැත්වීමට නොහැකි වී ඇති බවයි. ඉන් පසුව 2018 වර්ෂයේ ආරක්ෂක නියාමක තනතුරට බඳවා ගැනීම සඳහා අදාළ සම්මුඛ පරීක්ෂණය 2018-08-01, 02 දිනවලදී පවත්වන ලද අතර, එහි ප්‍රතිඵල මත අයදුම්කරුවන් 63 දෙනෙකු සමත්වූවද පුරප්පාඩුව පැවති ආරක්ෂක නියාමක තනතුරු 46 ක් සඳහා ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුවන් 46 ක් සඳහා 2018-10-01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පත්වීම් ලබාදී ඇති බව දක්වා ඇත.

අනතුරුව ආරක්ෂක නියාමක පුරප්පාඩු පිරවීමේදී එම පරීක්ෂණයෙන් ලකුණු 40 ලබා සමත්වූ පැමිණිලිකරු ආරක්ෂක නියාමක තනතුරට සුදුසුකම් ලැබුවද පත්වීම ක්‍රියාත්මක වන දිනට වයස අවුරුදු 45 ඉක්මවූ අයදුම්කරුවකු වන බැවින් පත්වීම් බලධාරියාගේ තීරණය මත මෙම පත්වීම ලබාදීමට නොහැකි වී ඇති බවද දක්වා ඇත.

මේ අනුව පැමිණිලිකරු 2018-10-01 වන දිනට පත්වීම් ලබාදීමේදී පළමු අවස්ථාවේ සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් 46 දෙනා අතරට අයත් වූයේ නම් පැමිණිලිකරුට අදාළ පත්වීම ලබාදීමේ හැකියාව තිබූ බවද දක්වා ඇත.

**නිරීක්ෂණ හා නිගමනය -:**

වර්ෂ 2017 ක් වූ මාර්තු මස 31 වන දින පුවත්පත් දැන්වීමක් මගින් ප්‍රශ්නගත තනතුර ප්‍රසිද්ධ කර ඇති අතර, එහි 06 වන අයිතමයෙන් දැක්වෙන්නේ අයදුම්පත් භාරගන්නා දිනට අවශ්‍ය සියලුම සුදුසුකම් සපුරා තිබිය යුතුය යනුවෙනි. ඒ අනුව ඉල්ලුම්පත්‍ර කැඳවන ලද අවසාන දිනට

පැමිණිලිකරුට වයස අවුරුදු 43 මාස 04 පමණ වන බැවින් පුවත්පත් දැන්වීම ප්‍රකාරව පැමිණිලිකරුට වයස අවුරුදු 45 සම්පූර්ණ වී නොමැත. නමුත් පත්වීම ක්‍රියාත්මක දිනට වයස අවුරුදු 45 සම්පූර්ණ වී ඇති බැවින් පැමිණිලිකරුට පත්වීම ප්‍රදානය කර නොමැත. මෙම ප්‍රමාදය පැමිණිලිකරුගේ පාලනයකින් තොර සිදුවූවක් වන අතර, පරිපාලනමය ප්‍රමාදයක් නිසා සිදුවූවක් බව නිරීක්ෂණය වේ.

සේවකයාගේ පාලනයකින් තොරව පරිපාලනමය ප්‍රමාදවීම් මත සිදුවන ප්‍රමාදයන්වලදී පැමිණිලිකරුට අගතියක් සිදු නොවිය යුතු බවට ශ්‍රේෂ්ඨාධිකරණය විසින්ද වරින් වර නියෝග ලබාදී ඇත. එසේම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති අනුවද පරිපාලනමය ප්‍රමාදයන් සේවකයින්ගේ පාලනයකින් තොර බැවින් සේවකයාට අගතියක් වන ලෙස භාවිතා නොකළ යුතු බව දක්වයි.

මෙම ප්‍රශ්නගත කාරණයේදී පළාත් පාලන මැතිවරණය යනාදී හේතුන් මත අදාළ සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම ප්‍රමාද වී ඇති බව නිරීක්ෂණය වේ. එය පැමිණිලිකරුගේ පාලනයෙන් තොරව සිදුවූ ක්‍රියාවකි. එසේම, පුවත්පත් දැන්වීමේ 06 අයිතමය ප්‍රකාරව පැමිණිලිකරු අයදුම් කරන දිනට සුදුසුකම් සම්පූර්ණ කර ඇත. එබැවින් පරිපාලන ප්‍රමාද වීම පැමිණිලිකරුට අගතියක් වන ලෙස භාවිතා කිරීම යුක්ති සහගත නොවන බව කොමිෂන් සභාවේ නිරීක්ෂණයයි.. මෙම කරුණු අනුව වගඋත්තර පාර්ශවය විසින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවේ සඳහන් මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

ඒ අනුව, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවේ සඳහන් මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට අනාවරණය වී ඇති බැවින්, පැමිණිලිකරුට බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කොළඹ මහ නගර සභාවේ ආරක්ෂක නියාමක තනතුර 2019-02-01 වන දිනට පෙරදාතම් කර හිඟ වැටුප් හා දීමනාද සහිතව ලබාදීමට පියවර ගත යුතු බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2023. 04. 28 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර. එදිනට පෙර අදාල දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

අනුසූයා ෂන්මුගනාදන්.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

ම.හේ.නිමල් කරුණාසිරි.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

B/-